අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education
'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 | +94112785818
info@moe.gov.lk | www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref.: ED/17/03/01/01/01
ඔබේ යොමුව / உமது இல. / Your Ref.:
දිනය / திகதி / Date: 2025.12. 15

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්

සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්

සියලු ම පිරිවෙන් පරිවේණාධිපති හිමිවරුන්

සියලු ම රජයේ හා රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් වෙත

## 2026 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම

## වැඩිදුර අධ්‍යයන මොඩියුල හා පරිවර්තනීය කුසලතා මොඩියුල පිළිබඳ උපදෙස් සංග්‍රහය

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා වන පූර්ව උපදෙස් සංග්‍රහය මැයෙන් යුතු අංක ED/17/03/01/01/01 හා 2025.10.22 දිනැති ලිපියට වැඩිමනත් වශයෙනි.

අධ්‍යාපනයේ පරිවර්තනීය වෙනසක් තුළින් පරිවර්තනීය ශ්‍රී ලංකාවක් බිහි කිරීම සඳහා 2026 වර්ෂයේ සිට ක්‍රියාත්මක නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ 6 වන ශ්‍රේණියේ සිට සිසුන්ගේ ලැදියාව සහ රුචිකත්වයට ගැළපෙන ලෙස තෝරා ගත හැකි නව ඉගෙනුම් ක්ෂේත්‍ර හඳුන්වා දීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව 21 වන සියවසේ කුසලතා පිළිබඳ අවධානය යොමු කරමින් ප්‍රාදේශීය, දේශීය හා ජාත්‍යන්තර අවශ්‍යතාවන්ට ගැළපෙන ඉගෙනුම් ක්ෂේත්‍ර හඳුනා ගෙන ඊට අනුරූපී ලෙස මොඩියුල සකස් කිරීමට විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ පියවර ගෙන ඇත.

ඒ අනුව අත්‍යවශ්‍ය මොඩියුල සමඟ වැඩිදුර අධ්‍යයන හා පරිවර්තනීය කුසලතා මොඩියුල පන්ති කාමරය තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

මේ පිළිබඳව විද්වත් අදහස් හා යෝජනා පිළිබඳව අවධානය යොමු කරමින් ජාතික අධ්‍යාපන ආයතනය විසින් සකස් කරන ලද වැඩිදුර අධ්‍යයන මොඩියුල හා පරිවර්තනීය කුසලතා මොඩියුල පන්ති කාමර තුළ ක්‍රියාත්මක කිරීමේ දී පහත උපදෙස් පිළිපදින ලෙස දන්වමි.

ගරු අමාත්‍යතුමිය / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk
moesecretaryoffice@gmail.com

## 1. වැඩිදුර අධ්‍යයන මොඩියුල

මූලික විෂයයන්ගෙන් ඔබ්බට උනන්දුවක් දක්වන හෝ අදාළ වන විෂය ක්ෂේත්‍ර පුළුල් කිරීමට හෝ විශේෂීකරණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දීම මෙම වැඩිදුර අධ්‍යයන මොඩියුල හඳුන්වා දීමේ අරමුණ වේ. මෙහි දී උසස් අධ්‍යාපන අවස්ථා හෝ වෘත්තියකට මග පෙන්වීමක්, අවශ්‍ය කුසලතා වර්ධනය කිරීම හා ශිෂ්‍ය උනන්දුව සපුරාලීමට අපේක්ෂිත ය.

### I. වැඩිදුර අධ්‍යයන මොඩියුල තෝරා ගැනීම

- අත්‍යවශ්‍ය විෂයයන් 14කට අදාළ ව වැඩිදුර අධ්‍යයන මොඩියුල සකස් කර ඇත. එක් සිසුවෙකු විසින් තමා කැමති විෂයයන් 03 යටතේ වැඩිදුර අධ්‍යයන මොඩියුල 03ක් තෝරා ගත හැකි ය.
- එක් වාරයක් සඳහා වැඩිදුර අධ්‍යයන මොඩියුල 03ක් සම්පූර්ණ කළ යුතු අතර ඒ සඳහා එක් වැඩිදුර අධ්‍යයන මොඩියුලයකට පැය 10 බැගින් පැය 30ක කාලයක් සිසුන්ට භාවිත කළ හැකි ය.
- මෙම වැඩිදුර අධ්‍යයන මොඩියුල සඳහා සතියකට කාලච්ඡේද 03ක් වෙන් වී ඇත.
- සම්පූර්ණ කරන ලද වැඩිදුර අධ්‍යයන මොඩියුල සඳහා වාරයකට සම්භාර 03ක් සිසුන්ට උපයා ගත හැකි ය.

### II. 2026 වර්ෂයේ 6 ශ්‍රේණියට I වාරයේ සිට හඳුන්වා දෙනු ලබන වැඩිදුර අධ්‍යයන මොඩියුල

- 2026 වර්ෂයේ I වාරයට විෂයයන් 06ක් සඳහා වැඩිදුර අධ්‍යයන මොඩියුල 06ක් හඳුන්වා දෙනු ලැබේ.
- එක් එක් විෂයයන් සඳහා වැඩිදුර අධ්‍යයන මොඩියුල හඳුන්වා දීමට ඉදිරියේ දී කටයුතු කරනු ඇත.
- 2026 වර්ෂයේ I වාරය සඳහා හඳුන්වා දෙනු ලබන විෂයයන්ට අදාළ වැඩිදුර අධ්‍යයන මොඩියුල පහත පරිදි වේ.

| අනු අංකය | විෂය | වාරය | වැඩිදුර අධ්‍යයන මොඩියුලයේ නම | මාධ්‍ය | | |
|---|---|---|---|---|---|---|
| | | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| 1. | ගණිතය | I | සංඛ්‍යා සමඟ සෙල්ලම් කරමු | √ | √ | √ |
| 2. | විද්‍යාව | I | විමසුම් මනසක් සඳහා ප්‍රවේශයක් | √ | √ | √ |
| 3. | ඉතිහාසය | I | ජීවයේ කතන්දරය | √ | √ | √ |
| 4. | සාහිත්‍ය රසවින්දනය | I | සාහිත්‍ය උල්පත | √ | √ | √ |
| 5. | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | I | ශ්‍රව්‍ය ගොනු සමඟ වැඩ කරමු | √ | √ | √ |
| 6. | ජීවිතය සඳහා තාක්ෂණය | I | ව්‍යවහාරික තාක්ෂණවේදය | | | |
| | | | I. තේ | √ | √ | |
| | | | II. පොල් | √ | √ | |
| | | | III. මැණික් හා ස්වර්ණාභරණ | √ | √ | |
| | | | IV. ජලජ සම්පත් | √ | √ | |
| | | | V. විදුලිය හා ඉලෙක්ට්‍රොනික | √ | √ | |

- වැඩිදුර අධ්‍යයන මොඩියුල පන්තිකාමරය තුළ ක්‍රියාත්මක කිරීමේ දී පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කිරීම සුදුසු ය.
- සතියකට වෙන් වී ඇති කාලච්ඡේද 03 වෙන් වෙන් වශයෙන් ක්‍රියාත්මක විය යුතු ය.
- විෂයයන්ට අදාළ වැඩිදුර අධ්‍යයන මොඩියුල කාණ්ඩ 03කට වෙන් කර එක් කාලච්ඡේදයක දී විෂයයන් දෙකකට අදාළ වැඩිදුර අධ්‍යයන මොඩියුල භාවිතයට අවස්ථාව ලබා දීම කළ හැකි ය.

උදා :- $X_1$' $X_2$, $X_3$, $X_4$, $X_5$ හා $X_6$ ලෙස විෂයයන් දැක්වූ විට,

| | | | | | |
|---|---|---|---|---|---|
| $X_1$ | $X_2$ | $X_3$ | $X_4$ | $X_5$ | $X_6$ |

| | | |
|---|---|---|
| පළමු කාලච්ඡේදය | $X_1$ | $X_2$ |
| දෙවන කාලච්ඡේදය | $X_3$ | $X_4$ |
| තෙවන කාලච්ඡේදය | $X_5$ | $X_6$ |

- එක් කාණ්ඩයකින් එක් විෂයය බැගින් විෂයන් 03ක් සිසුන් තෝරා ගත යුතුය.

  උදා :- $X_1$, $X_3$, $X_5$ හෝ

  $X_2$, $X_4$, $X_6$ විය හැකි ය.

- ශිෂ්‍ය සංඛ්‍යාව සහ ගුරු සංඛ්‍යාව අනුව ද පාසලට අභිමත පරිදි ක්‍රියාත්මක කළ හැකි විෂය සංඛ්‍යාව 06කට වැඩිය තෝරා ගත හැකි ය.
- එක් කාලච්ඡේදයක දී විෂයන් 02ක් හෝ වැඩි ගණනක් හෝ ක්‍රියාත්මක කිරීමේ දී සම්පත් උපරිම උපයෝජනය සඳහා එක් විෂයක් හදාරන ශිෂ්‍ය සංඛ්‍යාව අවම වශයෙන් 05-10ත් අතර වීම සුදුසු ය.
- ජීවිතය සඳහා තාක්ෂණවේදය විෂය හා සම්බන්ධව ව්‍යවහාරික තාක්ෂණවේදය යටතේ සකස් කර ඇති මොඩියුල අතරින් ප්‍රාදේශීය වශයෙන් වැදගත් හා සිසුන්ගේ කැමැත්ත පරිදි පළමු වාරයට සිසුවෙකුට මොඩියුල පහ අතරින් එක් මොඩියුලයක් තෝරා ගත හැකි ය. දෙවන සහ තෙවන වාරවල දී ඉතුරු මොඩියුල හතර අතරින් එක බැගින් තෝරා ගත හැකි ය.
- එක් කාලච්ඡේදයක් සඳහා මොඩියුල 02ක් හෝ කිහිපයක් හෝ ක්‍රියාත්මක කිරීමේ දී අදාළ විෂය හා සම්බන්ධ ගුරුවරුන් ඒ සඳහා යෙදවිය යුතු ය.

  උදා :- කාලච්ඡේද 03න් එක කාලච්ඡේදයක දී ගණිතය හා විද්‍යාව යන වැඩිදුර අධ්‍යයන මොඩියුල සිසුන් අධ්‍යයන සඳහා තෝරා ගන්නේ නම් ගණිතය සහ විද්‍යාව ගුරුවරුන් ඒ සඳහා යෙදවිය යුතු ය.

| | |
|---|---|
| $x_1$ | $x_2$ |

- සමාන්තර පන්ති 02ක් හෝ කිහිපයක් හෝ පවතින විට පන්ති 02ක් හෝ 03ක් හෝ ඒකාබද්ධ කරමින් එක ම වේලාව තුළ මෙම විෂය ක්‍රියාත්මක කළ හැකි ය.

  උදා :- 6A + 6B - 4 වන කාලච්ඡේදය

  6C + 6D - 6 වන කාලච්ඡේදය

- පාසලක යම් ශ්‍රේණියක එක් සමාන්තර පන්තියක් පමණක් පවතී නම්, එහි ශිෂ්‍ය සංඛ්‍යාව හා ගුරු සංඛ්‍යාව අනුව ක්‍රියාත්මක කළ යුතු විෂයන් සංඛ්‍යාව තෝරා ගත යුතු ය.

## 2. පරිවර්තනීය කුසලතා මොඩියුල

රැකියාවට සහ ජීවිතයට අවශ්‍ය කුසලතා අත්කර ගැනීමට අවශ්‍ය පදනමක් ලබා දෙමින් සිසුන්ගේ සමස්ත සංවර්ධනය සහතික කිරීම මෙම මොඩියුලය හඳුන්වා දීමේ අරමුණයි. මෙහි දී 21 වන සියවසේ කුසලතා ගොඩනැගීම, සාරධර්ම සහ පුරවැසිභාවය වර්ධනය කිරීම සහ සමස්ත සංවර්ධනයට සහය වීම අපේක්ෂිත ය.

## I. පරිවර්තනීය කුසලතා මොඩියුල තෝරා ගැනීම

තෝරාගත් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ පරිවර්තනීය කුසලතා මොඩියුල සකස් කර ඇත. එක් සිසුවෙකු විසින් එම ක්ෂේත්‍ර අතරින් 02කට අදාළ මොඩියුල 02ක් අධ්‍යයනය සඳහා තෝරා ගත යුතු ය.

එක් වාරයක් සඳහා පරිවර්තනීය කුසලතා මොඩියුල 02ක් සම්පූර්ණ කළ යුතු අතර ඒ මඟින් සිසුන්ට සම්භාර 02ක් උපයා ගත හැකි ය. එක් මොඩියුලයක් සඳහා කාලය පැය 10කි. මොඩියුල 02ක සම්පූර්ණ කිරීමට පැය 20ක් හිමි වේ. ඒ සඳහා සතියකට කාලච්ඡේද 02ක් වෙන් වී ඇති අතර තෝරා ගන්නා විෂය ක්ෂේත්‍ර 02 සඳහා වෙන් වී ඇති කාලච්ඡේද 02 භාවිත කළ යුතු ය.

## II. පරිවර්තනීය කුසලතා විෂය ක්ෂේත්‍ර

2026 වර්ෂයේ 6 ශ්‍රේණියේ I වාරය සඳහා පහත සඳහන් ක්ෂේත්‍රයන්ට අදාළ පරිවර්තනීය කුසලතා මොඩියුල 02ක් හඳුන්වා දෙනු ලැබේ. ඉදිරි වාරවල දී විවිධ ක්ෂේත්‍රයන්ට අදාළ පරිවර්තනීය කුසලතා මොඩියුල හඳුන්වා දීමට කටයුතු කරනු ඇත.

- ගෝලීය අධ්‍යයනය
- සමාජ සත්කාරක සේවා

| අනු අංකය | ක්ෂේත්‍රය | වාරය | මොඩියුලයේ නම | මාධ්‍ය | | |
|---|---|---|---|---|---|---|
| | | | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි |
| 1. | ගෝලීය අධ්‍යයනය | I | විවිධත්වය තුළ ජීවත් වීම. | √ | √ | √ |
| 2. | සමාජ සත්කාරක සේවා | I | මනුසත් මෙහෙවර | | | |
| | | | ➢ කුස පිරුණු සිනහවකට ආදරයේ දෑත් | √ | √ | √ |
| | | | ➢ දිවි සැරියට සිසු සවිය | √ | √ | √ |
| | | | ➢ කසළ අවම සොඳුරු හෙටක් | √ | √ | √ |

- ඉහත ක්ෂේත්‍ර 02 සඳහා අදාළ මොඩියුල 2026 වර්ෂයේ 6 ශ්‍රේණියේ I වාරය සඳහා ලබා දෙන අතර කාලච්ඡේද 02න් එක් කාලච්ඡේදයක් ගෝලීය අධ්‍යයනය යටතේ සකස් කර ඇති "විවිධත්වය තුළ ජීවත් වීම" මොඩියුලය සඳහා භාවිත කළ යුතු ය. අනෙක් කාලච්ඡේදය "සමාජ සත්කාරක සේවා" මොඩියුලය සඳහා භාවිත කළ යුතු ය.
- ගෝලීය අධ්‍යයනය විෂය ක්ෂේත්‍රය සඳහා භූගෝල විද්‍යාව ගුරුවරුන් පුහුණු කිරීමට ජාතික අධ්‍යාපන ආයතනය විසින් කටයුතු කර ඇති අතර සමාජ සත්කාරක සේවා විෂය ක්ෂේත්‍රය සඳහා විද්‍යාව, පුරවැසි අධ්‍යාපනය, චිත්‍ර ආදි විෂය ගුරුවරුන් පුහුණු කිරීමට කටයුතු කර ඇත.
- සමාජ සත්කාරක සේවා විෂය ක්ෂේත්‍රය යටතේ මොඩියුල කිහිපයක් ඉදිරිපත් කරන අතර "මනුසත් මෙහෙවර" නම් විෂය ක්ෂේත්‍රය හඳුන්වා දීමේ මොඩියුලයත් සමඟ පහත සඳහන් මොඩියුල අතරින් එකක් එක් වාරයක් සඳහා තෝරා ගත යුතු ය.
    - ➢ කුස පිරුණු සිනහවකට ආදරයේ දෑත්
    - ➢ දිවි සැරියට සිසු සවිය
    - ➢ කසළ අවම සොඳුරු හෙටක්

ඉහත සඳහන් කරන ලද උපදෙස් අනුව පවතින සම්පත් උපරිම උපයෝජනය කර ගනිමින් වැඩිදුර අධ්‍යයන මොඩියුල සහ පරිවර්තනීය කුසලතා මොඩියුල 2026 වර්ෂයේ 6 ශ්‍රේණියේ සිට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන මෙන් දන්වමි.

නාලක කළුවැව
ලේකම්

පිටපත් :

1. සියලු ම පළාත් ලේකම්වරුන්
2. සියලු ම ගරු ආණ්ඩුකාරතුමන්ගේ ලේකම්
3. සියලු ම අතිරේක ලේකම්වරුන්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
4. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අධ්‍යාපන ආයතනය
5. විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
6. අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව
7. අධ්‍යාපන අධ්‍යක්ෂ, පාසල් කටයුතු, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
8. අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන සංවර්ධන, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
9. අධ්‍යාපන අධ්‍යක්ෂ, දත්ත කළමනාකරණ, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය